කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝබර්

**BCOM E 3073 - කළමනාකරණ තොරතුරු පද්ධති**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්ණ පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. පද්ධතියක් යනු කුමක්ද සහ තොරතුරු පද්ධතියක් යනු කුමක්ද යන්න හඳුනා ගන්න.

(ලකුණු 04)

ආ. තොරතුරු පද්ධතියක ප්‍රධාන උපාංග හඳුනා ගැනීම සඳහා දළ රූප සටහනක් ඇඳ, එක් එක් උපාංගය සඳහා උදාහරණ සපයන්න.

(ලකුණු 06)

ඇ. පහත දක්වෙන පද කෙටියෙන් විස්තර කරන්න.

i. දත්ත

ii. තොරතුරු

iii. තොරතුරු පද්ධති

iv තොරතුරු තාක්ෂණය

( එකකට ලකුණු 2.5 බැගින් ලකුණු 10)

( මුළු ලකුණු 20)

02. අ. ඔබට ශ්‍රිතීය දෘෂ්ටිකෝණය අනුව, තොරතුරු පද්ධති වර්ගීකරණය කළ හැක්කේ කෙසේද ? එක් එක් වර්ගීකරණය උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

ආ. මානව සම්පත් තොරතුරු පද්ධතියක් කළමනාකරුවෙකුට ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි කෙටියෙන් දක්වන්න.

(ලකුණු 04)

ඇ. තොරතුරු පද්ධති සම්පත් සුදුසු උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. අ. " විවිධ තොරතුරු පද්ධති සංවිධානයක තීරණ ගැනීමේ ක්‍රියාවලියට විවිධ ආකාරයෙන් දායකවේ". සංවිධානයක කළමනාකරණ මට්ටම් සහ තොරතුරු පද්ධති අතර ඇති සම්බන්ධතාවය කුමක්ද ?

(ලකුණු 05)

ආ. සංවිධානයක දැනුම් සේවකයින්ගේ වැදගත්කම හඳුනා ගන්න.

(ලකුණු 04)

ඇ. සංවිධානයක තොරතුරු පද්ධති මගින් ඉටු කළ හැකි වැදගත් භූමිකාවන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ඉ. " තොරතුරු පද්ධති යනු ආයතනයකට අගනාකම් නිර්මාණය කිරීමෙහිලා වැදගත් උපාංගයකි" පහදන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

04. අ. ඩිජිටල් ආයතනයක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ? ඩිජිටල් ආයතන් ප්‍රධාන වශයෙන් අර්ථ දක්වන්නේ කුමන පද්ධතීන් මගින්ද ?

(ලකුණු 05)

ආ. "ඩිජිටල් ආයතනයන්හි මතු වීම පැතලි සංවිධාන නිර්මාණයෙහිලා මඟ පෙන්වයි". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද ? හේතු පහදන්න.

(ලකුණු 05)

ඇ. විද්‍යුත් වෙළෙඳපොලක් යනු කුමක්ද ? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඉ. ගෝලීය ආර්ථිකයේ සංවර්ධනය ව්‍යාපාර ලෝකය තුල තොරතුරු පද්ධතීන් හි වැදගත්කම සඳහා බලපාන්නේ කෙසේද?

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

05. අ. වර්තමානයේදී ඔබට විද්‍යුත් වාණිජ්‍යයෙහි අත්දැකීම ලබා ගත හැකි වෙබ් අඩවි හඳුනාගන්න.

(ලකුණු 04)

ආ. නවීන ව්‍යාපාර ලෝකය තුල අන්තර්ජාලයෙහි ඔබට කළහැකි දේවල් මොනවාද ?

(ලකුණු 05)

ඇ. ඔබ විද්‍යුත් ව්‍යාපාර විද්‍යුත් වාණිජ්‍යයෙන් වෙන්කොට දක්වන්නේ කෙසේද ?

(ලකුණු 05)

ඉ. විද්‍යුත් වානිජ්‍යමය ගනුදෙනු වල නියැලීමේදී, සංවිධානයන් විසින් සැලකිය යුතු ආරක්ෂණ ක්‍රියාමාර්ග හඳුනාගන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

06. අ. සයිබර් අපරාධ සඳහා වන උපාංගයක් ලෙස පරිගණකය යොදා ගත හැක්කේ කෙසේද ?

(ලකුණු 05)

ආ. "තොරතුරු පද්ධතියක් සඳහා වන තර්ජනයක්, දූර්වලතාවයක් පාලනය කිරීම මගින් වැළැක්විය හැක". පද්ධතියක් දූර්වල විය හැකි හේතු සාධක හතරක් හඳුනා ගන්න.

(ලකුණු 04)

ඇ. පරිගණක සුරක්ෂිතභාවයෙහි ප්‍රධාන උපාංග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ඉ. පහත රූප සටහන් මගින්, ප්‍රභවයේ සිට ගමනාන්තය දක්වා වන සාමාන්‍ය දත්ත ගලා යෑමක් සඳහා, බලය නොලත් පාර්ශවයක් විසින් අනවසර ප්‍රවේශයක් ලබා ගැනීම දක්වයි. පරිගණක සුරක්ෂිතභාවයෙහි උපාංග වලට අදාලව මෙම ආක්‍රමණය පැහැදිලි කරන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

රූප සටහන 01




රූප සටහන 02

